# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 40 දරන
# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත

---

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1979 ජූනි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : රු. 1.10 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 101/78.

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන අමාත්‍ය සභාව සංස්ථාපනය කිරීම සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පිහිටුවීම සඳහා ද ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනයට අවශ්‍ය බලතල එකී මණ්ඩලය වෙත පවරාදීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලසීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා, ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මේ පනත 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

## I වන කොටස

### අපනයන සංවර්ධන අමාත්‍ය සභාව සංස්ථාපනය කිරීම

අපනයන සංවර්ධන අමාත්‍ය සභාව සංස්ථාපනය කිරීම.

2. (1) මෙහි පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත අපනයන සංවර්ධන අමාත්‍ය සභාවක් විය යුතු ය:—

(අ) ජනාධිපතිවරයා, ඔහු සභාවේ සභාපති විය යුතු ය.

(ආ) වෙළෙඳ, නාවික කටයුතු, කර්මාන්ත, කෘෂිකර්මය, වැවිලි කර්මාන්ත, පේෂ කර්මාන්ත, ධීවර, මුදල්, විදේශ කටයුතු, ක්‍රම සම්පාදන සහ ග්‍රාමීය කර්මාන්ත යන විෂය යන් භාර අමාත්‍යවරලයා්.

(2) අපනයන සංවර්ධන අමාත්‍ය සභාව, අමාත්‍ය මණ්ඩලය විසින් දෙනු ලබන යම් පොදු හෝ විශේෂ විධානවලට යටත්ව, ජාතික අපනයන සංවර්ධන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වග කිව යුතු ය.

## II වන කොටස

### ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පිහිටුවීම සහ එහි සංයුතිය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පිහිටුවීම.

3. (1) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය යනුවෙන් හැඳින්වෙන, මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන මණ්ඩලයක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරන යම් දිනයක සිට, පිහිටුවනු ලැබේ.

(2) මණ්ඩලය අඛණ්ඩ පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන්නේ ය. තම ද ව්‍යවස්ථාපිත නාමයෙන් මණ්ඩලය විසින් නඩු පැවරීම ද මණ්ඩලයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැක්කේ ය.

(3) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටුවනු ලැබිය යුතු ය.

2—ඒ 41423—12,900 (79/05)

(4) මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව, ශ්‍රී ලංකාව ඇතුළත හෝ ශ්‍රී ලංකාවෙන් පිටත හෝ යම් ශාඛා කාර්යාලයක් හෝ නියෝජ්‍යායතනයක් පිහිටුවා පවත්වාගෙන යා හැකි ය.

මණ්ඩලයේ සංයුතිය.

4. (1) මණ්ඩලය මෙහි පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) කාර්මික ව්‍යාපාරවල, වෙළෙඳ කටයුතුවල හෝ මූල්‍ය කටයුතුවල නැතහොත් අපනයන සංවර්ධනය හා සම්බන්ධ වෙනත් යම් ක්ෂේත්‍රයක පළපුරුද්දක් ඇතැයි සහ දක්ෂතාවක් පෙන්නුම්කර ඇතැයි පෙනීයන තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු සභාපතිවරයෙක් සහ සෙසු සාමාජිකයන් හය දෙනෙක් ;

(ආ) වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයා ;

(ඇ) නැව් කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයා ;

(ඈ) කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයා ;

(ඉ) කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයා ;

(ඊ) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයා ;

(උ) පේෂ කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයා ;

(ඌ) ධීවර විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයා ;

(එ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයා ;

(ඒ) විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයා ;

(ඔ) ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයා ;

(ඩ) ග්‍රාමීය කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වරයා හෝ අතිරේක ලේකම්වරයා ; සහ

(ඪ) ජනාධිපතිවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, මහා කොළඹ ආර්ථික කොමිසමෙහි සාමාජිකයෙක්.

(2) (1) වන උපවගන්තියේ (ආ) සිට (ඩ) තෙක් වූ ඡේදවල නිශ්චය කොට දක්වා ඇති විෂය දෙකක් හෝ වැඩි ගණනක් එක් අමාත්‍යවරයකුට පවරනු ලැබ ඇත්තා වූ හෝ එක් අමාත්‍යවරයකු භාරයේ ඇත්තා වූ අවස්ථාවක ඒ විෂයයන් වෙනුවෙන් ඒ අමාත්‍ය වරයා විසින් එක් සාමාජිකයකු පමණක් නම් කරනු ලැබිය යුතු ය.

(3) (අ) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නම් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු බවට පත් වුවහොත්, හෝ

(ආ) යම් තැනැත්තෙක් ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නොවේ නම් හෝ යම් තැනැත්තකුගේ ශ්‍රී ලංකා පුරවැසිභාවය නතර වුවහොත්

ඒ තැනැත්තා (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ඪ) ඡේදය යටතේ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකත්වය දැරීමට හෝ නුසුදුස්සෙක් වන්නේ ය.

(4) (1) වන උපවගන්තියේ (අ) සහ (ඪ) ඡේද යටතේ අමාත්‍යවරයා විසින් පත් කරන ලද සභාපතිවරයා සහ සාමාජිකයෝ, (5) වන සහ (8) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, තුන් අවුරුදු කාලසීමාවක් ධුරය දරන්නාහ. එහෙත් නැවත පත් කරනු ලැබීම සඳහා ද ඔවුහු සුදුස්සෝ වන්නාහ.

(5) (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ඪ) ඡේදය යටතේ පත් කරන ලද මණ්ඩලයේ සභාපතිවරයා හෝ වෙනත් යම් සාමාජිකයකු හෝ අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් හේතු කිසිවක් නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. එවැනි ඉවත් කිරීමක් පිළිබඳව කිසිදු අධිකරණ යක ප්‍රශ්න නොකළ යුතුය :

එසේ වුවද, (1) වන උපවගන්තියේ (ඪ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයා, ජනාධිපතිවරයාගේ එකඟත්වය නොමැතිව, මේ උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් නොකළ යුතු ය.

(6) (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ඪ) ඡේදය හෝ යටතේ පත් කරන ලද මණ්ඩලයේ සභාපතිවරයා හෝ වෙනත් යම් සාමාජිකයකු හෝ විසින් ධුරය හිස් කරනු ලැබූ විටෙක හෝ මෙයට ඉහතින් වූ උපවගන්තියේ විධිවිධාන යටතේ මණ්ඩලයේ සභාපතිවරයා හෝ වෙනත් යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබූ විටෙක ඒ ධුරය දැරීම සඳහා, අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු ඒ තැනැත්තා අනුප්‍රාප්ත වන ධුරය දැරූ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කොටස තුළ ධුරය දැරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය :

එසේ වුවද එම ධුරය හිස් කළ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයා (1) වන උපවගන්තියේ (ක) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයා නම්, ජනාධිපතිවරයාගේ එකඟත්වය නොමැතිව මේ උපවගන්තිය යටතේ පත් කිරීමක් නොකළ යුතු ය.

(7) රෝගාතුරවීම නිසා නැතහොත් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ක) ඡේදය හෝ යටතේ පත් කරන් ලද සභාපතිවරයා හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ ස්වකීය ධුරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව අපොහොසත් වුවහොත් ඔහු වෙනුවෙන් සභාපතිවරයා වශයෙන් හෝ සාමාජිකයකු වශයෙන් හෝ වැඩබැලීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය :

එසේ වුවද එසේ ස්වකීය ධුරයේ කාර්ය ඉටුකිරීමට අපොහොසත් ව සිටින සාමාජිකයා (1) වන උපවගන්තියේ (ක) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයා නම් ජනාධිපතිවරයාගේ එකඟත්වය නොමැතිව මේ උපවගන්තිය යටතේ පත් කිරීමක් නොකළ යුතු ය.

(8) තමා ධුරයෙන් ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා අමතා ලිපියක් යැවීමෙන් මණ්ඩලයේ සභාපතිවරයාට හෝ යම් සාමාජිකයකුට හෝ ඕනෑම වේලාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(9) මණ්ඩලයේ සභාපතිවරයාට හෝ යම් සාමාජිකයකුට අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(10) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටුකිරීමේ දී මණ්ඩලය, අමාත්‍යවරයා විසින්, අවශ්‍ය අවස්ථාවන් හි, මණ්ඩලයෙහි නියෝජනය වී ඇති අමාත්‍යාංශ භාර අමාත්‍යවරයන් විමසා, කලින් කල කරනු ලැබිය හැකි සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් විය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම් ගණපූරණය සහ කාර්ය විධානය විසිමත් කර හැකීම.

5. (1) මණ්ඩලයේ රැස්වීම් සෑම මසකම යටත් පිරිසෙයින් එක් වරක් ද මේ පනත යටතේ මණ්ඩලයේ වගකීම් ඉටුකිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන පරිදි ඊට අතිරේකව වරින්වර ද පවත්වනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා පැමිණ සිටින්නේ නම් මණ්ඩලයේ සෑම රැස්වීමක ම ඔහු මුලසුන දැරිය යුතු ය. යම්කිසි රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත් පැමිණ සිටින සාමාජිකයන් විසින්, තමන් අතුරෙන් එක් සාමාජිකයකු ඒරැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කර ගත යුතු ය.

(3) මණ්ඩලයේ කවර වූ හෝ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හත් දෙනකු විය යුතු ය.

(4) මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් සාදන ලද රීතිවලින් නිශ්චය කොට දැක්වෙන පරිදි විය යුතු ය.

*මණ්ඩලයේ සභාපතිවරයාගේ බලතල යනාදිය.*

6. (1) මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ ප්‍රධාන විධායක වන්නේ ය.

(2) මණ්ඩලයේ කටයුතු මෙහෙයවීම ද මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම ද මණ්ඩලයේ සේවානියුක්තයන් සම්බන්ධයෙන් පරිපාලන බලය ද මණ්ඩලයේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත් ව සභාපතිවරයාට භාර වන්නේ ය.

(3) ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරෙන් පවරාදීම අවශ්‍ය යයි සභාපතිවරයා කලින් කල සලකන බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව සභාපතිවරයා විසින් මණ්ඩලයේ කවර හෝ සේවානියුක්තයකුට ලියවිල්ලක් මගින් පවරා දිය හැකි අතර එසේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් පවරාදෙනු ලැබූ යම් සේවානියුක්තයකු විසින් ඒවා ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සභාපතිවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව කළ යුතු ය.

*මණ්ඩලයේ සාමාජිකයන් විසින් සම්බන්ධතා හෙළිදරව් කළ යුතු බව.*

7. මණ්ඩලය විසින් කරන හෝ කිරීමට යෝජනා කරන යම් ව්‍යාපාර කටයුත්තකට කෙලින් ම හෝ අන් අයුරකින් මූල්‍ය සම්බන්ධතාවක් ඇති මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් ඒ සම්බන්ධතාවේ ස්වභාවය, ඒ ව්‍යාපාර කටයුත්ත පිළිබඳව සාකච්ඡා කරන මණ්ඩලයේ රැස්වීමේ දී හෙළිදරව් කළ යුතු ය. ඒ හෙළිදරව් කිරීම මණ්ඩලයේ රැස්වීම් වාර්තාවෙහි වාර්තාගත කළ යුතු ය. තවද, ඒ සාමාජිකයා ඒ කටයුත්ත සම්බන්ධයෙන් කෙරෙන සලකා බැලීම්වලට සහ තීරණයට සහභාගි නොවිය යුතු අතර එකී සලකා බැලීම් කරගෙන යන අවස්ථාවේ දී හෝ තීරණයට එළඹෙන අවස්ථාවේ දී රැස්වීමෙන් ඉවත්ව සිටිය යුතු ය.

*පුරප්පාඩු ආදිය හේතුවෙන් මණ්ඩලයේ කටයුතු නිර්බල නොවන බව.*

8. මණ්ඩලයේ සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් පැවතීමේ හේතුවෙන් හෝ මණ්ඩලයේ සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල නොවිය යුතු ය.

*කමිටු පිහිටුවීමට මණ්ඩලයට බලය ඇති බව.*

9. (1) මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම පිණිස මණ්ඩලය විසින් මණ්ඩලයේ සාමාජිකයන් නොවන තැනැත්තන් ද ඇතුළුව, තැනැත්තන් යම් සංඛ්‍යාවකින් සමන්විත කමිටු, පිහිටුවනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය අතුරින්, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය එකී කමිටුවලට මණ්ඩලය විසින් පවරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද එක් එක් කමිටුව විසින් ඒ ඒ කමිටුවේ ගණපූරණය හා රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය තීරණය කළ යුතු ය.

උපදේශක කමිටු පිහිටුවීම.

10. (1) නිශ්චිත නිෂ්පාදන, නිෂ්පාදන වර්ග හා වෙළෙඳ ද්‍රව්‍ය මෙන්ම අපනයන වෙළෙඳාමේ සංකාර්ය අංග වැඩි දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට ගත් උපදේශක කමිටු, මණ්ඩලයේ උපදෙස් මත අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය ය යි අමාත්‍යවරයා සලකන යම් කාරණයක් හෝ සියලු කාරණා සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් දීම ඒ එක් එක් කමිටුවේ කර්තව්‍යය විය යුතු ය.

(3) ඒ එක් එක් උපදේශක කමිටුවට, අමාත්‍යවරයා විසින් තීරණය කරන යම්කිසි කාලසීමාවකට, අමාත්‍යවරයා විසින් තීරණය කරන නියමයන් හා කොන්දේසි මත යම් සාමාජික සංඛ්‍යාවක් මණ්ඩලයේ උපදෙස් පරිදි අමාත්‍යවරයා විසින් පත් කළ හැකි ය.

(4) එක් එක් උපදේශක කමිටුවේ රැස්වීමක ගණපූරණය සඳහා අවශ්‍ය සාමාජික සංඛ්‍යාව තීරණය කිරීම ද ඇතුළුව, ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීමට, ඒ එක් එක් කමිටුවට බලය ඇත්තේ ය.

(5) තමා ධුරයෙන් ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන් සාමාජිකයකුට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) ඉල්ලා අස්වීමෙන් හෝ ස්වකීය ධුර කාලය ඉකුත් වීමෙන් හෝ ධුරය හිස් කරන සාමාජිකයෙක් නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

(7) රෝගාතුරවීමේ හෝ අන්කිසි අබලතාවක හෝ හේතුවෙන් නැතහොත් ශ්‍රී ලංකාවෙහි නොසිටීමේ හේතුවෙන් ස්වකීය ධුරයේ කාර්ය කිරීමට සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වන යම් අවස්ථාවක ඒ සාමාජිකයා වෙනුවට වැඩ බැලීමට අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(8) කවර හෝ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවස්ථානුකූල යයි අමාත්‍යවරයා සලකන්නේ නම් අමාත්‍යවරයා විසින් උපදේශක කමිටුවක කවර හෝ සාමාජිකයකු, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ මුද්‍රාව.

11. (1) මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කරගත හැකි ය.

(2) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, කිසිම සාධන පත්‍රයකට හෝ ලියවිල්ලකට මණ්ඩලයේ මුද්‍රාව නොතැබිය යුතු ය. ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඒ සාධන පත්‍රයට හෝ ලියවිල්ලට අත්සන් තැබිය යුතු ය.

## III වන කොටස

### මණ්ඩලයේ බලතල හා කර්තව්‍ය

මණ්ඩලයේ බලතල හා කර්තව්‍ය.

12. (1) මණ්ඩලයේ බලතල හා කර්තව්‍ය පහත දැක්වෙන බලතල සහ කර්තව්‍ය විය යුතු ය :—

(අ) ජාතික අපනයන සංවර්ධන ප්‍රතිපත්තිය සහ වැඩ සටහන් පිළිබඳව අපනයන සංවර්ධන අමාත්‍ය සභාවට උපදෙස් දීම ;

(ආ) අපනයනය මුල් කොටගත් ආයෝජන පිළිබඳ ප්‍රතිපත්ති සහ පියවර, අපනයන සංවර්ධන අමාත්‍ය සභාවට නිර්දේශ කිරීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනයට මං සලසන වෙළෙඳ ගිවිසුම් පිළිගැනීමට නිර්දේශ ඉදිරිපත් කිරීම හෝ රටවල් අතර වාණිජ ප්‍රතිපත්ති, මූල්‍ය සහ වෙනත් ඒ හා සම්බන්ධ වැඩ පිළිවෙලවල් ඇතිකර ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඈ) ජාතික අපනයන සංවර්ධන සැලැස්මක් සහ වැඩ සටහනක් අපනයන සංවර්ධන අමාත්‍ය සභාවේ අනුමතය සඳහා සකස් කිරීම ;

(ඉ) ජාතික අපනයන සැලැස්ම සහ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පරීක්ෂාකාරී වීම සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙහි ලා ක්‍රියාකාරී ලෙස ආධාර දීම ;

(ඊ) අපනයන නිෂ්පාදන සැපයුම් සංවර්ධනය කිරීමෙහි ලා පහසුකම් ඇති කිරීම ;

(උ) අපනයන සංවර්ධන අරමුදල පාලනය කිරීම සහ ආණ්ඩුවේ විවිධ නියෝජිත ආයතන ද වෙළෙඳ හා කර්මාන්ත ක්ෂේත්‍රවල නියෝජිත ආයතන ද සමග සමීප සහයෝගයෙන් අපනයනය සඳහා වූ නිෂ්පාදනය සහ අලෙවි කටයුතුවලට සහාය දීමේ සියලු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඌ) අපනයනකරුවන්ට අපනයනය හා සම්බන්ධ සියලු ගැටළු විසඳා ගැනීමට කටයුතු කළ හැකි, ආණ්ඩුව ඇතුළත වූ කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියා කිරීම ;

(එ) ශ්‍රී ලංකා නිෂ්පාදනයන්ට අදාලව අපනයන විභවතා පිළිබඳ සමීක්ෂණ පැවැත්වීම ;

(ඒ) අපනයන නිෂ්පාදන සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම සහ අපනයන නිෂ්පාදන සංවර්ධනය කිරීම ;

(ඔ) විදේශ විනිමය උපයා ගැනීම පිණිස ශ්‍රී ලංකාවෙන් වෘත්තීය සහ උපදේශක සේවා අපනයනය ප්‍රවර්ධනය කිරීම ;

(ඕ) ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම් වර්ධනය කරන වෙළෙඳ ආයතන, ඉංජිනේරු හා සංවර්ධන වැඩ සහ වෙනත් කටයුතු විදේශයන්හි ඇති කිරීම ; ප්‍රවර්ධනය කිරීම සහ ඊට අනුග්‍රහය දැක්වීම ;

(ඝ) අපනයනාභිමුඛ ව්‍යාපෘතිවල යෝග්‍යතාව පිළිබඳ අධ්‍යයන කරගෙන යාම සහ අපනයන් සංවර්ධනය සඳහා වූ යම් විශේෂ ව්‍යාපෘති නියාමක පදනමක් මත භාර ගැනීම ;

(ඟ) ඒකාබද්ධ අපනයන සමූහ ව්‍යාපාර, අපනයන ව්‍යාපාරික ආයතන සහ වෙනත් සංවිධාන පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම සහ ඊට අනුග්‍රහය දැක්වීම ;

(ච) විදේශයන්හි සිටින ශ්‍රී ලංකා වෙළෙඳ නියෝජිතයන්ගේ සහ වෙළෙඳ අනුයෝජිතයන්ගේ අලෙවි සංවර්ධන කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය ;

(ජ) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා ඇති සංවිධාන හා පුද්ගල මණ්ඩල සමඟ එක්ව, අපනයන සංවර්ධන හා ප්‍රවර්ධන ක්ෂේත්‍රයෙහි කාර්මික සහයෝගිතාව ක්‍රියාත්මක කරන අනුයෝජිත ආයතනය ලෙස ක්‍රියා කිරීම ;

(ට) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන සීමාවන්ට සහ කාර්ය පටිපාටිවලට යටත්ව—

(i) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක හෝ සංස්ථාගත කර ඇත්තා වූ ද ශ්‍රී ලංකාවේ හෝ විදේශයක හෝ ව්‍යාපාර කටයුතු කරගෙන යන්නා වූ හෝ කර ගෙන යාමට අදහස් කරන්නා වූ ද යම් ව්‍යාපාරික ව්‍යවසායක කොටස්, ස්කන්ධ හෝ වෙනත් යම් සම්බන්ධතාවක් අත්කර ගැනීම,

(ii) වෙළෙඳ කටයුතු වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයක හෝ යම් තැනැත්තකුට නැතහොත් සංවිධානයකට මුදල් ණයට දීම ;

(ඩ) මේ පනතින් මණ්ඩලය වෙත පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව සියලුම අපනයන කරුවන් සඳහා පහත සඳහන් ආකාරයේ වූ පොදු අපන යන සේවා ක්‍රියාත්මක කිරීම හෝ සැපයීම—

(i) නිෂ්පාදකයන්ට සහ වෙළෙඳුන්ට තත්කාලීනව වැදගත් වන වෙළෙඳ තොරතුරු,

(ii) විදේශීය වෙළෙඳපලවල අලෙවි පර්යේෂණය,

(iii) අපනයන වෙළෙඳ පොළවල් සඳහා නව නිෂ්පාදන බිහිකිරීමෙහි හා පවත්නා නිෂ්පාදන අපනයන් වෙළෙඳපලවලට ගැළපෙන සේ සකස් කිරීමෙහි ලා සහාය වීම,

(iv) අත්ගදා බැලීමේ අලෙවි වැයම් ද ඇතුළුව නව නිෂ්පාදනයක් අලෙවි කිරීමෙහි හෝ නව වෙළෙඳපලකට ඇතුළුවීමෙහි ආරම්භක අවස්ථාවන්හි දී සහායවීම,

(v) කොළඹ දී සහ විදේශවල යම් ස්ථානයන්හි ගැණුම් කරුවන් හා විකුණුම්කරුවන් අතර හමුවීම් සංවිධානය කිරීම,

(vi) අපනයන උපදේශක සේවා,

(vii) වෙළෙඳ ප්‍රදර්ශන, වෙළෙඳ සල්පිල් සහ වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීමේ වෙනත් උපක්‍රමවලට සහභාගි වීමෙහි ලා සහායවීම,

(viii) වෙළෙඳාම ප්‍රවර්ධනය සහ අපනයන අළෙවි කටයුතු පිළිබඳ පුහුණුවීමේ පාඨමාලා,

(ix) අපනයන භාණ්ඩ නිෂ්පාදක පුද්ගලයන් විසින් සහ අපනයනකරුවන් විසින් මුහුණපාන ගැටළු විසඳා ගැනීමෙහි ලා සහාය වීම,

(x) තත්ව පාලන ප්‍රමිති, ඇසිරීම, අපනයන ණය පහසුකම් සහ රක්ෂණය සම්බන්ධයෙන් සහාය වීම,

(xi) ආනයන සහ අපනයන ක්‍රියාවලියෙහි දී සහ ලේඛන සම්පාදනයෙහි දී සහාය වීම;

(ණ) යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීම සහ දැරීම හෝ මණ්ඩලය විසින් අත්කර ගන්නා ලද නැතහොත් දරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපලක් බැහැර කිරීම;

(ත) මණ්ඩලය විසින් සපයන සේවාවන් හෝ පහසුකම් සඳහා ගාස්තු හෝ වෙනත් අයකිරීම් ලබා ගැනීම;

(ද) දේශීය ප්‍රභවයන්ගෙන් මෙන්ම විදේශීය ප්‍රභවයන්ගෙන් ද මුදලින් වුවද අන්‍යාකාරයකින් වුවද තෑගි, ප්‍රදාන, ආධාර හෝ සහනාධාර පිළිගැනීම සහ මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ඒවා යෙදීම;

(න) මෙහි පහත සඳහන් කාරණා, එනම්:—

(i) අපනයන නිෂ්පාදන විකිණීම හා අපනයනය විධිමත් කිරීම සහ නැව්ගත කිරීම, නැව් කුලී, බ්‍රෝකර් ගාස්තු, ගුදම් ගාස්තු හෝ අපනයන නිෂ්පාදන විදේශයන්හි විකිණීමෙහි ලා දරන වෙනත් ගාස්තුවලට අදාළ කාර්ය සංවිධානය සහ ඒවා ගෙවීම විධිමත් කිරීම,

(ii) අපනයන නිෂ්පාදන සම්බන්ධයෙන් වූ රක්ෂණ, ණය, තත්ව පාලනය, ප්‍රමිතිකරණය, ඇසිරීම සහ අභ්‍යන්තර ප්‍රවාහණය විධිමත් කිරීම,

(iii) ඒකාබද්ධ අපනයන සමූහ ව්‍යාපාර, අපනයන ආයතන සහ අපනයන කටයුතුවල නිරත වෙනත් සංවිධාන පිහිටුවීම විධිමත් කිරීම හා ඒවායේ වැඩ කටයුතු විධිමත් කිරීම

සම්බන්ධයෙන්, යම් පවත්නා නීතියක විධිවිධාන නොමැත්තා වූ ද ඒ කරුණු සඳහා නියෝග සෑදීම අවශ්‍යානුකූල බව මණ්ඩලයේ මතය වන්නා වූ ද අවස්ථාවක, ඒ කාරණා සඳහා මේ පනත යටතේ නියෝග සාදන ලෙස අමාත්‍යවරයාට නිර්දේශ කිරීම; සහ

(ප) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ මණ්ඩලය අතු බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම හා සම්බන්ධ හෝ එය වඩා කාර්යක්ෂම කර ගැනීම අරභයා වෙනත් සියලු ක්‍රියා හෝ දේවල් කිරීම.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේහි ලා මණ්ඩලය විසින් ගනු ලබන සෑම තීරණයක් ම, මණ්ඩලයේ නියෝජනය වන සෑම අමාත්‍යාංශයක් ම විසින් ක්‍රියාත්මක කළ යුතුය :

එසේ වුවද, මණ්ඩලය විසින් ගනු ලබන යම් තීරණයක්, අපනයන සංවර්ධන අමාත්‍ය සභාව විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් හෝ වෙනස් කරනු ලැබිය හැකිය.

## IV වන කොටස

## මුදල්

අපනයන සංවර්ධන අරමුදල

13. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අපනයන සංවර්ධන අරමුදල යන් නමින් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. ඒ අරමුදලට පහත සඳහන් මුදල් බැර කළ යුතු ය :—

(අ) මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා කලින් කල පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන් ;

(ආ) ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි දී සහ ඉටුකිරීමෙහි දී මණ්ඩලයට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඇ) ශ්‍රී ලංකාව තුළ වුව ද ශ්‍රී ලංකාවෙන් පිටත වුව ද කවර වූ හෝ ප්‍රභවයකින් ණය, ආධාර, තෑගි හෝ ප්‍රදාන වශයෙන් මණ්ඩලයට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන් ; සහ

(ඈ) ආනයන මත හෝ යම් අපනයන මත මේ පනත යටතේ පනවන සියලු සෙස් බදුවලින් ලැබෙන මුදල්.

(2) මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි හා ඉටු කිරීමෙහි ලා මණ්ඩලයට දරන්නට වන යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණයන් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ ආරම්භක සංවර්ධන අරමුදල රුපියල් දශ ලක්ෂ අසූවක් විය යුතු ය. ආරම්භක අරමුදලේ මුදල් ප්‍රමාණය, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා විමසා තීරණය කරන කොටස් වලින් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර ඒ මුදල් ප්‍රමාණ, අරමුදලට බැර කළ යුතු ය.

ආනයන මත හා අපනයන මත සෙස් බදු අයකිරීම

14. (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි අනු ප්‍රමාණ අනු ව වූ සෙස් බද්දක් ගැසට් පත්‍රයේ පළ කරන නියමය මගින්, ඒ නියමයේ නිශ්චය කොට දැක්වෙන යම් ආනයන හා අපනයන මත, නියම කර අය කළ හැකි අතර ගෙවනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ නියම කරන ලද සෙස් බදු මුදල වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ ඒ හා සමාන නියමයක් මගින් කළ හැකි ය.

(3) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන හැම නියමයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි දී හෝ නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයේ සිට මාස හතරක් ඇතුළත, එය අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියමයක්, එය යටතේ කලින් කරන ලද කිසිවක වලංගු භාවයට හානියක් නොමැතිව, අනනුමතයේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) මේ වගන්තිය රේගු ආඥාපනතේ කොටසක් වූවාක් සේ බලපැවැත්විය යුතු අතර, ඒ ආඥාපනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ සෙස් බදු වශයෙන් අයකර ගන්නා මුදල්, ප්‍රධාන රේගු අයකැමිවරයා විසින්, මාස්පතා, අරමුදලේ බැරට ගෙවිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ නියම කරන ලද සෙස් බද්ද වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අය කරනු ලබන ආනයන බද්දකට හෝ අපනයන බද්දකට හෝ සෙස් බද්දකට අමතරව විය යුතු ය.

15. මේ පනත යටතේ මණ්ඩලයේ වගකීම් ඉටුකිරීම සඳහා හෝ කාර්ය ඉටුකිරීම සඳහා මණ්ඩලයට අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණයන්, අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ අමාත්‍යවරයා විසින් දෙන ලද පොදු අධිකාරයක නියමයන්ට අනුකූලව, අයිරා අණකර මගින් හෝ අන්‍යාකාරයකින් හෝ තාවකාලිකව ණයට ගත හැකි ය : මණ්ඩලයේ ණය ගැනීමේ බලතල.

එසේ වුව ද මණ්ඩලය විසින් මේ වගන්තිය යටතේ ලබා ගන්නා ලද තාවකාලික ණය මුදල් වෙනුවෙන් ආපසු ගෙවීමට ඉතිරිව ඇති මුළු මුදල, කිසිම අවස්ථාවක දී, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරන යම් මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය.

16. 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, මණ්ඩලයේ මූල්‍ය පාලනය කෙරෙහි, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය. 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළවීම.

17. මණ්ඩලයේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය. මණ්ඩලයේ මුදල් වර්ෂය.

18. (අ) මණ්ඩලයේ ලාභ සහ ආදායම් ; සහ ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

(ආ) අරමුදලින් මණ්ඩලය විසින් සහනාධාරයක් හෝ ආධාර මුදලක් වශයෙන් යම් තැනැත්තකුට ගෙවනු ලැබූ යම් මුදලක්

ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

## කාර්ය මණ්ඩලය

මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා

**19.** (1) අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු විය යුතුය. අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ ලේකම්වරයා විය යුතුය.

(2) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ එසේ තීරණය කරනු ලබන අනුප්‍රමාණ මත අධ්‍යක්ෂ ජනරාල්වරයාට පාරිශ්‍රමික ගෙවිය යුතු අතර, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සේවා නියම සහ කොන්දේසිවලට ඔහු යටත් විය යුතුය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරනු ලබන අවස්ථාවක, 20 වන වගන්තියේ (3) වන, (4) වන, (5) වන සහ (6) වන උපවගන්තිවල විධිවිධාන ඔහුට හා ඔහු සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතුය.

නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් පත් කිරීම

**20.** (1) මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ හා ඉටුකිරීමේ කාර්ය සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන යම් නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) ඒ නිලධරයන්ට, සේවකයන්ට සහ අනුයෝජිතයන්ට පාරිශ්‍රමික ගෙවීම, මණ්ඩලය විසින් සාදනු ලබන රීතිවලින් නිශ්චය කොට දැක්වෙන ආකාරයට සහ ගෙවීම් අනුප්‍රමාණ අනුව ගෙවිය යුතු අතර එසේම නිශ්චය කොට දැක්වෙන සේවා කොන්දේසිවලට ඔවුහු යටත් වන්නාහ.

(3) මණ්ඩලයේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේ ද ඔහු පත් කරන බලධරයාගේ ද කැමැත්ත ඇතිව, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට, ඒ හා සමාන කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාල සීමාවකට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය. නැතහොත් ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකිය.

(4) රාජ්‍ය සේවයේ නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ වන්නේ ය. එවැනි යම් නිලධරයකු පත් කරනු ලබන්නේ මණ්ඩලයේ යම් තනතුරකට ද ඒ තනතුරට අයත් සියලු දීමනා ඇතුළුව මුළු පාරිශ්‍රමිකය, ව්‍යවස්ථාපිත අඩු කිරීම්වලට සහ මණ්ඩලය විසින් අනුමත කරන වෙනත් යම් අඩු කිරීම්වලට යටත්ව, ලැබීමට ඒ නිලධරයාට හිමිකම ඇත්තේ ය.

(5) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(6) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින්, ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළඹුණු යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා මණ්ඩලයට සේවය කරන යම් සේවා කාලයක් ඒ ගිවිසුමෙහි බැඳීම් ඉටු කිරීම සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සැලකිය යුතු ය.

## VI වන කොටස

## පොදු විධිවිධාන

**21.** ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

(1) මණ්ඩලයේ කාර්ය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍ය වන්නා වූ ද යෝජිත අත්කර ගැනීම අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අනුමත කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ දේපළ පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය ලෙස සැලකිය යුතු අතර ඒ අනුව එය ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අනිවාර්යයෙන් අත්කරගෙන මණ්ඩලයට පැවරිය හැකි ය.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ මණ්ඩලය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු යම් මුදලක් මණ්ඩලය විසින් ගෙවිය යුතු ය.

**22.** රජයේ චංචල හා නිශ්චල දේපළ මණ්ඩලයට ලබා දිය යුතු බව.

(1) රජයේ යම් නිශ්චල දේපළක්, මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍යවන අවස්ථාවක, ඒ කාර්යය, රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ පිළිබඳ විශේෂ ප්‍රදානයක් කළ හැකි හෝ බද්දක් දිය හැකි කාර්යයක් ලෙස සැලකිය යුතු අතර ඒ අනුව ඒ ආඥාපනතේ විධිවිධාන මණ්ඩලය වෙත ඒ දේපළ පිළිබඳව කරනු ලබන විශේෂ ප්‍රදානයකට හෝ දෙනු ලබන බද්දකට අදාළ වන්නේ ය.

(2) රජයේ යම් චංචල දේපළක් මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, ඒ චංචල දේපළෙහි සන්තකය හා ප්‍රයෝජනය මණ්ඩලය වෙත පවරා සතු කර දෙනු ලැබිය හැකි ය.

**23.** අමාත්‍යවරයාගේ විධාන

(1) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් කලින් කල අමාත්‍යවරයා විසින් මණ්ඩලයට විශේෂ හෝ සාමාන්‍ය විධාන කළ හැකි අතර මණ්ඩලය ඒ විධාන පිළිපැදිය යුතු ය.

(2) මණ්ඩලයේ දේපළ, කාර්ය හා වැඩ කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට අවශ්‍ය විය හැකි තොරතුරු සපයන ලෙස අමාත්‍යවරයා විසින්, කලින් කල, මණ්ඩලයට ලිඛිතව විධාන කළ හැකි අතර මණ්ඩලය ඒ සෑම විධානයක් ම පිළිපැදිය යුතු ය.

**24.** තොරතුරු ලබා ගැනීමට බලය ඇති බව.

යම් නිෂ්පාදනයක් හෝ වෙළෙඳ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම, එකතු කිරීම, සකස් කිරීම හෝ අපනයනය කිරීම පිළිබඳ යම් තොරතුරු මණ්ඩලයේ සභාපතිවරයා විසින් නැතහොත් විශේෂයෙන් හෝ පොදුවේ සභාපතිවරයා විසින් බලය දෙන ලද මණ්ඩලයේ යම් නිලධරයකු විසින්, තමර හෝ තැනැත්තකුගෙන් හෝ සංවිධානයකින් හෝ කැඳවීම නීත්‍යානුකූල වන්නේ ය.

මණ්ඩලයේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

25. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා මණ්ඩලයේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

26. මණ්ඩලය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

27. (1) (අ) මණ්ඩලය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව ; හෝ

(ආ) මණ්ඩලයේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින්, මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නො ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව හෝ කවර වූ හෝ අධිකරණයක පවරන ලද කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් අරමුදලින් ගෙවිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට ගෙවන ලද හෝ මණ්ඩලය විසින් අයකර ගන්නා ලද යම් නඩු ගාස්තුවක් අරමුදලට බැර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධාන මත හෝ කරන ලද නැතහොත් කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව කවර වූ හෝ අධිකරණයක පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කළහොත්, ඒ වියදම එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකර නො ගන්නා ලද නම්, අරමුදලින් ගෙවිය යුතු ය.

රහස්‍යභාවය.

28. මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම, නිලධරයකු ම, සේවකයකු ම, අනුයෝජිතයකු ම හෝ විගණකවරයකු ම, ස්වකීය කාර්ය භාරගැනීමට ප්‍රථම මණ්ඩලයේ සියලු ගනුදෙනු පිළිබඳව ද ඒ ගනුදෙනුවලට සම්බන්ධ සියලු කාරණා පිළිබඳව ද දැඩි රහස්‍යභාවයක් රකින බවට ගිවිස ගනිමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතු ය. එවැනි කිසිම ගනුදෙනුවක් හෝ කාරණයක්—

(අ) හෙළිදරව් කරන ලෙස මණ්ඩලය විසින් හෝ අධිකරණයක් විසින් හෝ ඒ ගනුදෙනුව නැතහොත් කාරණය අදාළ වන තැනැත්තා විසින් හෝ ඉල්ලා සිටිනු ලැබූ විට ;

(ආ) ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී ; සහ

(ඇ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන අනුව ක්‍රියා කිරීමෙහි දී

හැර හෙළිදරව් නොකිරීමට, ඒ ප්‍රකාශයෙන් ඔහු ගිවිස ගත යුතු ය.

**29.** (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය. නියෝග.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුනු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අමාත්‍යවරයා විසින්, විශේෂයෙන්—

(අ) අපනයන භාණ්ඩ විකිණීම සහ අපනයනය සම්බන්ධයෙන් ද නැව්ගත කිරීම, නැව් කුලී, බ්‍රෝකර් ගාස්තු, ගුදම් ගාස්තු හෝ අපනයන නිෂ්පාදන විදේශයන්හි විකිණීමෙහි ලා දරන වෙනත් ගාස්තුවලට අදාළ කාර්ය සංවිධානය සහ ඒවා ගෙවීම සම්බන්ධයෙන් ද පවත්නා ලිඛිත නීතියක කිසි විධිවිධානයක් නොමැති අවස්ථාවල, ඒ සඳහා ;

(ආ) අපනයන නිෂ්පාදන සම්බන්ධයෙන් වූ රක්ෂණ, ණය, තත්ත්ව පාලනය, ප්‍රමිතිකරණය, ඇසුරීම සහ අභ්‍යන්තර ප්‍රවාහණය සම්බන්ධයෙන් පවත්නා ලිඛිත නීතියෙහි කිසි විධිවිධානයක් නොමැති අවස්ථාවල, ඒ සඳහා ;

(ඇ) ඒකාබද්ධ අපනයන සමූහ ව්‍යාපාර, අපනයන ආයතන සහ අපනයන කටයුතුවල නිරත වෙනත් සංවිධාන පිහිටුවීම සහ ඒවායේ වැඩ කටයුතු සඳහා ;

(ඈ) අපනයනකරුවන් ලියාපදිංචි කිරීමේ යෝජනා ක්‍රමයක් සැලසීම සඳහා ;

(ඉ) නියෝග සෑදීමට මේ පනතින් නියම කරනු ලබන්නේ හෝ බලය දෙනු ලබන්නේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ කාරණා සඳහා

නියෝග සෑදිය හැක ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ නියෝගය පළ කරනු ලැබූ දින හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලබන සෑම නියෝගයක් ම ඒ අනනුමතියේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සැලකිය යුතු නමුදු ඒ යටතේ කලින් කරන ලද කිසිවකට එයින් හානියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් ප්‍රත්‍යාදිෂ්ට කරන ලදැයි සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

රීති සෑදීමට මණ්ඩලයට ඇති බලය.

**30.** (1) රීති සෑදීමට මේ පනතින් බලය දී ඇති හෝ නියම කර ඇති කාරණා සියල්ලම හෝ ඉන් යමක් හෝ වෙනුවෙන් මණ්ඩලය විසින් රීති සෑදිය හැකි ය.

(2) මේ පනත යටතේ මණ්ඩලය විසින් සාදනු ලද කිසිම රීතියක්, අමාත්‍යවරයා විසින් අනුමත කරන තෙක් බලාත්මක නොවන්නේ ය.

වැරදි.

**31.** මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝග යක හෝ රීතියක හෝ යම් විධිවිධානයක් කඩකරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තෙක්ම වරදක් කරනු අතර මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ කල්හි ඒ තැනැත්තා රුපියල් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත පමණ ද දායක මුදල් භාරගනු ලැබේ.